**ශීර්ෂය 327 - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව**

------------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශනය**

--------------------

**1.1 තත්ත්වාගණනය කල මතය**

--------------------------------

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම**

----------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

----------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2008 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය වෙනුවෙන් පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොවූ බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සඳහා අනුරූප වන බව තහවුරු කල නොහැකි විය.

(ආ) ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් එම වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

පහත සඳහන් නිරීන්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය පිළියෙල කල යුත්තේ ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පදනම් කරගෙනය. එහෙත් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව රජයේ නිළධාරින්ගේ අත්තිකාරම් ගිණුම යටතේ ලැබීම්වල එකතුව වූ රු.19,973,024 ක් වුවද එය රු.203,451 ක් ලෙස දක්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ලැබීම්වල එකතුව මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව අනාවරණය කල යුතු වීම. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය මගින් මුදලින් කරනු ලබන ගණුදෙනු පමණක් ඇතුලත් කරන බැවින් මූල්‍ය බැරකම් පමණක් ඇතුලත් කර ඇත. |
| (ආ) | තැන්පත් ගිණුමේ වර්ෂය තුල බැරකිරීම්වල එකතුව රු.1,736,635 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ රු.183,390 ක් වශයෙන් සටහන් කර ඇති බැවින්, රු.1,553,245 ක තැන්පතු ලැබීම් අඩුවෙන් දක්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව තැන්පත් ගිණුමේ ශේෂය නිවැරදිව අනාවරණය කල යුතු වීම. | තැන්පත් ගිණුමේ මූල්‍ය බැරකම් වැරදීමකින් වෙනත් ලැබීම් යටතේ ගිණුම් ගත කර ඇත. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කෑගල්ල දිස්ත්‍රික් කාර්යාල ඉඩම සහ ගොඩනැගිල්ල, කුණ්ඩසාලේ නිවාඩු නිකේතන ගොඩනැගිල්ල, ගම්පහ දිස්ත්‍රික් කාර්යාලයේ ගොඩනැගිල්ල සහ දෙපාර්තමේන්තුවට අයිති වාහන 15 ක් තක්සේරුකර ගිණුම්වලට ගෙන නොතිබුණි. | වත්කම් ගිණුම්ගත කල යුතු වීම. | අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින අතර, එම කටයුතු අවසන් වීමෙන් පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ එකතුව වූ රු.90,517 ක බැරකම් මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරවු කර නොතිබුණි. | බැරකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කල යුතු වීම. | 2019 පෙබරවාරි 28 දිනට පෙර හඳුනාගන්නා ලද බැරකම් පමණක් අනාවරණය කර ඇත. |

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------ | ----------------------------- |
| ප්‍රසම්පාදන කමිටුවල හා තාක්ෂණික ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | ප්‍රසම්පාදන කමිටුවල හා තාක්ෂණික ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | ගොනු මට්ටමින් පවත්වාගෙන ගොස් ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1 වියදම් කළමනාකරණය**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------- | ------------------------- |
| මූලධන වැය විෂයයන් 04 කට අදාලව සියයට 24 ක සිට සියයට 50 ක දක්වා පරාසයක් තුල රු.මිලියන 4.22 ක් හා පුනරාවර්තන වැය විෂයයන් 04 කට අදාලව සියයට 08 ක සිට සියයට 23 ක් දක්වා පරාසය තුල රු.මිලියන 19.25 ක් වශයෙන් එකතුව රු.මිලියන 23.47 ක ප්‍රතිපාදන ඉතිරිකර තිබුණි. | තාත්වික පදනමින් ඇස්තමේන්තු පිළියෙල කර අයවැය විචලනය අවම කිරීමට කටයුතු කල යුතු වීම. | එම ඉතිරිවීම් සමස්ථ ප්‍රතිපාදනය සමග සැසඳීමේදී සියයට 7 ක් වැනි ඉතා අඩු අගයක් ගනී. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

--------------------------------

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------- | --------------------------- |
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව | කඩිනමින් කාර්යසාධන වාර්තාව | දෙපාර්තමේන්තුව විසින් කාර්යසාධන වාර්තාව සකස් |

| | | |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2019 මැයි 31 දින වන විටත්, සභාගතකර නොතිබුණි. | පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කල යුතු වීම. | කර 2019 අප්‍රේල් 05 දින ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත භාර දී ඇත. |

## 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) <u>ඉන්ධන දහනය පරීක්ෂාව</u> | | |
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව වාහන 15 ක ඉන්ධන දහනයවීම් පරීක්ෂා කර නොතිබුණි. | යථෝක්ත චක්‍රලේඛය පරිදි ඉන්ධන දහනය වීම් පරීක්ෂා කල යුතු වීම. | වාහන 33න් වාහන 18ක ඉන්ධන දහනය 2018 වර්ෂයේදී සිදු කර ඇති අතර ඉතිරි වාහන මෙම වසරේදී අවසන් කර ඇත. |
| (ආ) <u>නිශ්ක්‍රීය වත්කම්</u> | | |
| අලුත්වැඩියා කල නොහැකි තත්ත්වයේ පවතින දෙපාර්තමේන්තුව සතු වාහන 02 ක් වසර තුනක කාලයක් නිශ්ක්‍රීයව පැවතුණද, මෙතෙක් මේවා අපහරණය කිරීම හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු වී නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නිශ්ක්‍රීය වත්කම් සම්බන්ධයෙන් කටයුතු කල යුතු වීම. | අලුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් වාසි නොවන බැවින් අපහරණය සඳහා කටයුතු සිදු කෙරෙමින් පවතී. |
| (ඇ) <u>බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්</u> | | |

| | | |
|---|---|---|
| දෙපාර්තමේන්තුව සතු කාර් රථයක් ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත වර්ෂයකට අධික කාලයක් මුදා හැර තිබුණු අතර, එය පවරා දීමට හෝ ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් විධිමත්ව පවරා ගැනීමට හෝ පවරා දීමට කටයුතු කල යුතු වීම. | අමාත්‍යාංශය වෙත පවරාදීම සඳහා අදාළ ලියවිලි භාර දී ඇත. |

(ඇ) <u>වෙනත් ආයතන සතු වත්කම් පරිහරණය කිරීම</u>

| | | |
|---|---|---|
| වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අයත් වාහන 05 ක් හා UNDP ආයතනයට අයත් වාහනයක් ද දෙපාර්තමේන්තුව පරිහරණය කරමින් පැවතුනද මෙම වාහන පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කල යුතු වීම. | අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින අතර, එම කටයුතු අවසන් වීමෙන් පසු පවරා ගැනීමට කටයුතු කරනු ලබයි. |

**3.4 කළමනාකරණ දුර්වලතා**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙවර ඉටුකර ගැනීම සඳහා මූලිකවන ජාතික ඉඩම් පරිහරණ පනත සම්මත කර ගැනීමට මේ වන තෙක් කටයුතු කර නොතිබුණි. | ඉඩම් පරිහරණ පනත සම්මත කර ගැනීමට කඩිනමින් කටයුතු කල යුතු වීම. | මෙම දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර ඉටු කර ගනිමින් ජාතික ඉඩම් පරිහරණ පනත සම්මත කර ගැනීම සඳහා දෙපාර්තමේන්තු මට්ටමින් ගත හැකි පියවරයන් මේ වන විට ගනිමින් පවතී. |
| (ආ) | මියගිය නිළධාරියකුගෙන් සහ වැඩ තහනම් කල නිළධාරියකුගෙන් අයවිය යුතු වර්ෂ 05 ඉක්මවූ රු.27,998 ක ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව මේ දක්වා අපොහොසත් වී තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි අයනොවූ ණය ශේෂ සම්බන්ධයෙන් කටයුතු කල යුතු වීම. | මෙම ණය ශේෂ අයකර ගත නොහැකි ණයක් සේ සළකා කපා හැරීම සඳහා භාණ්ඩාගාරයෙන් ඉල්ලීමක් කර ඇත. |

**4. මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය වර්ධනය කර ගැනීම සඳහා බාධාවන ජ්‍යෝෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 08 ක්, තෘතියික මට්ටමේ පුරප්පාඩුවක් හා ද්විතියික මට්ටමේ පුරප්පාඩු 36 ක් පිරවීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතු වීම. | ජ්‍යෝෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 08 ක් බඳවා ගැනීමට කටයුතු කරමින් පවතින අතර, තෘතියික මට්ටමේ හා ද්විතියික මට්ටමේ පුරප්පාඩු 36 ක් පුරවා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. |